# <u>සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව</u>
## <u>තනතුරු පුරප්පාඩු</u>

සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුර සඳහා සුදුසුකම් ඇති ශ්‍රී ලාංකික අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| තනතුර | | පුරප්පාඩු ගණන |
|---|---|---|
| **විදුලි කාර්මික ශිල්පී** | | |
| 01 | ජාතික කලා නිකේතනය - කුණ්ඩසාලේ | 01 |

**02. සේවයේ නියුක්ත කිරීම සහ සේවා කොන්දේසි**

මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. එමෙන්ම වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට රජය මඟින් විටින් විට නියම කරන ආකාරයට දායක මුදල් ගෙවිය යුතුය.

වැටුප් කේත අංකය : PL 3 - 2025

වැටුප් පරිමාණය : රු.42,780 - 10 x 490 - 10 x 540 - 10 x 590 - 12 x 630 – 66,540/-

**I. අධ්‍යාපන සුදුසුකම් :**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයන් 06 කින් සමත්වීම.

**II. වෘත්තීය සුදුසුකම් :**

තනතුරෙහි කාර්ය භාරයට අදාළව තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබ ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතාවයන් (N.V.Q.) හතර (04) වන මට්ටමට නොඅඩු නිපුණතාවක් ලබා තිබිය යුතු අතර සහතික මඟින් එය සනාථ කළ යුතුය.

**III. පළපුරුද්ද :** ක්ෂේත්‍රයට අදාලව ලබා ඇති පළපුරුද්ද අමතර සුදුසුකමක් ලෙස සැලකේ.

**IV. කායික සුදුසුකම් :** සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරී ඉටුකිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

**V. වෙනත් සුදුසුකම් :**
1. අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතුය.
2. අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

**VI. වයස් සීමාව :** අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**03.** බඳවා ගැනීමේ ක්‍රමය : සංස්කෘතික කටයුතු අධ්‍යක්ෂ විසින් නියම කරන පරිදි වෘත්තීය පරීක්ෂණයෙන් සමත් ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් අතුරින් පුරප්පාඩු සංඛ්‍යාව මෙන් තුන්ගුණයක් යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. වෘත්තීය පරීක්ෂණයේ හා යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේ දෙකෙහිම එකතුවේ ඉහළම ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් අතුරින් කුසලතා අනුපිළිවෙල අනුව පවතින පුරප්පාඩු සංඛ්‍යාවට බඳවා ගනු ලැබේ.

➢ වෘත්තීය පරීක්ෂණය

| **විෂයයන්** | **උපරිම ලකුණු ප්‍රමාණය** | **සමත් ලකුණු ප්‍රමාණය** |
|---|---|---|
| 1. ක්ෂේත්‍රයට අදාළ මූලික දැනුම | 25 | 40% |
| 2. උපකරණ සවි කිරීම, අලුත්වැඩියා කිරීම පිළිබඳ දැනුම | 25 | |
| 3. අදාළ ක්ෂේත්‍රයේ උපකරණවල දෝෂ හඳුනා ගැනීම | 25 | |
| 4. ක්ෂේත්‍රයට අදාළ උපකරණ භාවිතය පිළිබඳ දැනුම | 25 | |
| මුළු ලකුණු | 100 | |

➢ යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය

| **පරීක්ෂා කර ලකුණු ලබා දෙනු ලබන ශීර්ෂ** | **උපරිම ලකුණු ප්‍රමාණය** | **සමත් ලකුණු ප්‍රමාණය** |
|---|---|---|
| (i). අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 30 | අදාල නොවේ |
| (ii). වෘත්තීය පළපුරුද්ද | 35 | |
| (iii). අතිරේක වෘත්තීය සුදුසුකම් | 30 | |
| (iv). සම්මුඛ පරීක්ෂණයේ දී දක්වනු ලබන කුසලතාවය | 05 | |
| එකතුව | 100 | |

**04.** අයදුම්පත් අමුණා ඇති ආකෘති පත්‍රය අනුව $A_4$ (210 mm X 297mm හෝ 21cm X 30cm) ප්‍රමාණයේ කඩදාසියක අංක 01 සිට 09 වන තෙක් කඩදාසියේ පළමුවැනි පිටුවේද , ඉතිරි කොටස් එහි දෙවන පිටුවේද වන පරිද්දෙන් තම අයදුම්පත්‍රය පිළියෙල කර 2026.06.12 දින හෝ ඊට පෙර ලැබෙන සේ **අධ්‍යක්ෂ, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව, 08 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් හා අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.
( අයදුම්පත් බහා එවන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරන තනතුර පැහැදිලිව සඳහන් කර එවිය යුතුය.)

සංස්කෘතික කටයුතු අධ්‍යක්ෂ,
සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව,
08 වන මහල,
සෙත්සිරිපාය,
බත්තරමුල්ල.